WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව පාලනය කිරීමෙන් අත්වන ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව බලතල බෙදා දක්වා ඇති ලැයිස්තුවලින් **දෙකක්** සඳහන් කරන්න.

(iii) බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iv) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමේදී මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** ලියන්න.

(v) ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූල **දෙකක්** සඳහන් කරන්න.

(vi) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න.

(vii) පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යන්ට අදාළ ප්‍රධාන තේමා **දෙකක්** ලියන්න.

(viii) අයිතිවාසිකම් දිනාගැනීම සඳහා ඇති වූ වැදගත් ඓතිහාසික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ix) පරිසර පද්ධතියේ සංරචක අතුරෙන් සමාජ පරිසරයට අයත් අංග **දෙකක්** ලියන්න.

(x) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** රටක නීතිය ක්‍රියාත්මක කිරීම යුක්ති සහගතව හා සාධාරණව සිදු වන්නේ නම් සමාජය ද නීතිගරුක වීම නිතැතින්ම සිදු වේ.

(i) නීතිය ආරම්භ වීමට බලපෑ නීතියේ මූලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) අග්‍ර විනිශ්චයකාරතුමා විසින් රීති සම්පාදනය කරන ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත සඳහන් කරන ලද එක් ලක්ෂණයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

**3.** ඍජුව හෝ වක්‍රව පාලන කටයුතු සඳහා මහජනතාවට සහභාගිවීමට අවස්ථාව ලබාදෙන පාලන ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලෙස හැඳින්වේ.

(i) ආණ්ඩුවක දක්නට ලැබෙන ප්‍රධාන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) වර්තමානයේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අපහසු වීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එක්** හේතුවක් අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන හා විවිධ සිරිත් විරිත් අනුගමනය කරන ජන කණ්ඩායම් එක්ව වාසය කිරීම බහු සංස්කෘතියක් ලෙස හැඳින්විය හැකි ය.

(i) ශ්‍රී ලංකාව තුළ බහු සංස්කෘතික සමාජයක් ඇති වීමට බලපෑ සාධකයක් වන සංක්‍රමණ සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ශිෂ්‍යයකු ලෙස ඔබ දෙවන භාෂාවක් ඉගෙන ගැනීමෙන් ලැබෙන වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක කිරීමෙන් ජනතාව අත්පත් කරගන්නා වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එකක්** සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**5.** පුද්ගල මනස තුළ ඇතිවන ඉලක්ක, අභිලාෂයන් සහ අවශ්‍යතාවන්ගේ විවිධත්වය මත ගැටුම් නිර්මාණය විය හැකි ය.

(i) රාජ්‍යයක් හෝ රාජ්‍ය දෙකක් අතර ඇතිවිය හැකි ගැටුම්වලට උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 02 යි)

(ii) මැදිහත්කරුවකු තෝරාගැනීමේදී විශේෂ අවධානය යොමු විය යුතු කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා පුරවැසියකු සතු විය යුතු පුද්ගල ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එක්** ගුණාංගයක් මගින් ගැටුම් නිරාකරණය කරගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

**6.** මනුෂ්‍යයන් ලෙස ගරුත්වයෙන් හා සමානාත්මතාවෙන් යුතුව සමාජයේ ජීවත්වීම සඳහා මානව අයිතිවාසිකම් අපට ප්‍රයෝජනවත් වේ.

(i) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) මගින් සහතික කර ඇති අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබෙන් ඉටු විය යුතු යුතුකම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

**7.** අප අවට ඇති ජීවී-අජීවී සියල්ල පරිසරයට අයත්වන බැවින් පරිසරය ආරක්ෂා කරගැනීම මානව වර්ගයාගේ පැවැත්මට හේතු වේ.

(i) ස්වභාවික සංසිද්ධීන් නිසා පරිසරයට සිදුවන හානි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ජලය දූෂණය වීමට බලපාන හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ජලය දූෂණය වීම වළක්වා ගැනීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ජලය දූෂණය වීම නිසා ඇති විය හැකි ගැටලු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03 යි)

* * *

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...